**2. ණය සහනයන් හි සැකැස්ම**

(i) 2020 ඔක්තෝබර් 01 දින සිට 2021 මාර්තු 31 දින දක්වා ණය සහන කාල සීමාව තුල අයවීමට නියමිත මූලික ණය මුදල සහ පොළිය කාලීන ණයකට හැරවීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කල යුතුය. බලපත්‍රලාභී බැංකු විසින් 2020 අප්‍රේල් 01 සිට 2020 සැප්තැම්බර් 30 දින දක්වා අයවීමට නියමිත මූලික ණය මුදල සහ පොළිය සහ 2020 ඔක්තෝබර් 01 දින සිට 2021 මාර්තු 31 දින දක්වා අයවීමට නියමිත මූලික ණය මුදල සහ පොළිය එකතු කරනු ඇත. ණය සහන කාල සීමාව තුල අය කල හැකි උපරිම පොළිය 7% කට සීමා කර ඇති සම වටිනාකමින් යුතු වාරික ණය (EMI loans) සඳහා මෙය අදාළ වන්නේ නැත.

(ii) මෙලෙස හරවන ලද ණය යලි අයකර ගැනීම ආරම්භ කිරීම 2021 ජුලි 01 දිනෙන් පසුව සිදු කල යුතුය.

(iii) මෙලෙස හරවන ලද ණය සඳහා බලපත්‍රලාභී බැංකු විසින් 2021 අප්‍රේල් 01 දින වන විට පවතින ආසන්නතම දින-365 භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි අනුපාතයට 1% ක් එකතු කල වාර්ෂික පොළියට නොවැඩි පොළී අනුපාතයක් අය කල හැක.

(iv) මෙම ණය ආපසු අය කරගැනීමේ අවම කාලය වසර දෙකක් වනු ඇත. කෙසේ නමුත්, ණය ගනුදෙනුකරු විසින් අදාළ ණය ඊට අඩු කාලයක් තුලදී පියවීමට අදහස් කරන්නේ නම් හෝ බලපත්‍රලාභී බැංකුව විසින් ණය ආපසු පියවීමට වසර දෙකට වඩා වැඩි කාලයක් ලබා දීමට සූදානම් අවස්ථාවන් හිදී එවැනි ඉල්ලීම් සඳහා බලපත්‍රලාභී බැංකු විසින් පහසුකම් සැලසිය හැක. මෙලෙස, ආපසු ගෙවීමේ කාලය වසර දෙකට වඩා වෙනස් වන විට ඒ සඳහා සුදුසු පොළී අනුපාතයක් ගනුදෙනුකරු හා බැංකුව විසින් ගිවිසගත යුතුවේ.

(v) මෙම චක්‍රලේඛය යටතේ සුදුසුකම් ලබන සක්‍රිය සහ අක්‍රිය ණය සඳහා, බලපත්‍රලාභී බැංකු විසින් 2020 ඔක්තෝබර් 01 දින වන විට එකතු වී ඇති සහ නොපියවා ඇති දඩ පොළී කපා හැරිය යුතුය. තවද, ණය සහන කාල සීමාව තුලදී දඩ පොළී එකතුකිරීම හෝ අය කිරීම නොකල යුතුවේ.

**3. වාර්තාකරණ අවශ්‍යතා**

බලපත්‍රලාභී බැංකු විසින් ණය සහන යෝජනාක්‍රමය ලබාගෙන ඇති ගනුදෙනුකරුවන්ගේ සෑම මසකම 30 වැනි දින වන විට පවතින තොරතුරු, 2020 නොවැම්බර් 01 දින සිට සෑම

